## ඔබ දැනුවත්ද?

ලාදුරු රෝගියකුට පහත ලක්ෂණ එකක් හෝ කිහිපයක්ද තිබිය හැකිය.

- ස්නායු ආශ්‍රිතව සිදුවන ආසාදන තත්ත්ව නිසා ස්නායු ඝනවීම, වේදනාව සහ හිරි ගතිය
- ස්නායු ක්‍රියාකාරීත්වය අඩුවීම නිසා මාංශ පේශීන්වල දුර්වල බව





## විශේෂ අවධානයට

- අත්පා හිරිවැටීම
- ඇඟිලි වකුටු වීම
- වළලුකරට පහළ පාදය පණ නැතිවීම (පාදය එසවීමට නොහැකි වීම)
- නිදාගත් විටදීත් ඇස් විවෘතව පැවතීම (රෝගය ඇස්වලට තදින් බලපෑවිට)

**ඉහත රෝග ලක්ෂණ ඔබට ඇත්නම්**

**ප්‍රමාද නොවන්න.**

ළඟම පිහිටි රජයේ රෝහලේ සමේ රෝග සායනයට පැමිණෙන්න.

# "සිනහවක නොරඳවමු කඳුලක්"

**ශ්‍රී ලංකා ජාතික රෝහල**
**මධ්‍යම ලාදුරු සායනය**
**දුරකථන අංකය : 011-2696444**

FAIR MED
Health for the poorest

"සිනහවක නොරඳවමු කඳුලක්"



## ලාදුරු ගැන මෙම විස්තර ඔබ දන්නවාද?

## ලාදුරු ගැන අළුත්ම කථාව

ලාදුරු බෝවන්නේ බැක්ටීරියාවක් මගිනි.

ප්‍රතිකාර නොගන්නා රෝගී අයෙකුගේ කැස්සක හෝ කිවිසුමක රැඳි බැක්ටීරියාව පරිසරයට එකතු වී, ස්වසනය මගින් නිරෝගී අයෙකුට රෝගය බෝවීම සිදුවේ.

**නිසි ප්‍රතිකාර නිසි කල ලබා ගැනීමෙන් ලාදුරු රෝගය සම්පූර්ණයෙන්ම සුවකර ගත හැකිය**

රෝගියෙකු නිසි ලෙස ප්‍රතිකාර ගැනීම ආරම්භ කර, දින කිහිපයකට පසු, අන් අයට රෝගය බෝවීම සිදු නොවේ.

## අවධානයෙන් සිටින්න



- සමෙහි ඇති වන ලා පැහැති, රතු හෝ තඹ පැහැති ලප



- එවැනි ලප මත දැනීම, ස්පර්ශය හා වේදනාව අඩුවීම හා කැසීමක් නොමැතිවීම



- එම ලප මත දහදිය දැමීමක් හෝ රෝම හට ගැනීමක් නොමැතිවීම.

## මේවා ලාදුරු රෝග ලක්ෂණ විය හැකිය

ලාදුරු රෝගය පිළිබඳ සියලු තොරතුරු සහ උපදෙස්, ඔබ ආසන්නයේම ඇති සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් හෝ රජයේ රෝහලේ සමේ රෝග සායනය මගින් ලබාගත හැකිය.